**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
**මාර්ගගතව විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් ඉදිරිපත් කිරීම - දේශීය අයදුම්කරුවන්**

**විදේශ ගමන් බලපත්‍රය මාර්ගගතව අයදුම් කිරීම සඳහා උපදෙස්**
**(කරුණාකර උපදෙස් හොඳින් කියවන්න)**

**1. අයදුම් කරන්නේ කෙසේද?**

1.1 ඔබට හදිසි සේවය හෝ සාමාන්‍ය සේවය සඳහා අයදුම් කළ හැකිය.

1.2 ඔබ හදිසි සේවය තෝරා ගනු ලබන්නේ නම්, ඔබගේ ඇඟිලි සලකුණු ග්‍රහණය කර දින තුනකට පසුව ඔබගේ විදේශ ගමන් බලපත්‍රය නිකුත් කරනු ඇත.

1.3 ඔබ සාමාන්‍ය සේවය තෝරා ගනු ලබන්නේ නම්, ඔබගේ ඇඟිලි සලකුණු ග්‍රහණය කර දින දාහතරකට පසුව ඔබගේ විදේශ ගමන් බලපත්‍රය නිකුත් කරනු ඇත.

**2. සුදුසුකම්**

2.1 මෙම සේවය ලබා ගැනීම සඳහා වන සුදුසුකම් නිර්ණායක පහත පරිදි වේ.

2.1.1. ඔබගේ අයදුම්පත ඉදිරිපත් කරන දිනට ඔබගේ වයස අවුරුදු 16 සම්පූර්ණ විය යුතුය.

2.1.2 ඔබට වලංගු විදේශ ගමන් බලපත්‍රයක් පවතීනම් එය ඔබ සතුව තිබිය යුතුය.

2.1.3 ඔබගේ ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/සම්පූර්ණ නම අසාදු ලේඛනගත නොවී තිබිය යුතුය.

2.1.4. අධිකරණය විසින් පනවන ලද සංචාරක තහනමක් ඔබට නොතිබිය යුතුය.

2.1.5 ත්‍රිවිධ හමුදාව හෝ රජයේ වෙනත් බලාත්මක කිරීමේ බලධාරීන් විසින් පනවන ලද සංචාරක තහනමක් ඔබට නොතිබිය යුතුය.

2.1.6 මෙම මාර්ගගත ගමන් බලපත්‍ර අයදුම්කිරීමේ ක්‍රමවේදය භාවිතා කරමින් රාජකාරි සහ රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර සඳහා ඉල්ලුම් කළ නොහැක.

2.1.7 ජාතික හැඳුනුම්පත අළුත් කිරීමේදී / නැවත නිකුත් කිරීමේදී ඔබේ ජාතික හැඳුනුම්පත් අංකය සම්පූර්ණයෙන්ම වෙනස් නොවී තිබිය යුතුය.

2.2 ඉහත 2.1හි සඳහන් නිර්ණායකයන්ට අනුකූල නොවේනම්, ඔබට මාර්ගගත ලෙස අයදුම් කිරීම සඳහා අවසර නොලැබේ. එවැනි අවස්ථාවලදී කරුණාකර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට හෝ ප්‍රාදේශීය කාර්යාලයට ගොස් ඔබේ ගමන් බලපත්‍රය ඉල්ලුම් කරන්න.

**3. අවශ්‍ය ලිපිලේඛන**

3.1 විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා පරිලෝකනය කර (Scanned), උඩුගත (Upload) කළ යුතු ලිපිලේඛන පහත පරිදිවේ.

3.1.1. ජාතික හැඳුනුම්පත (NIC)

3.1.2 උප්පැන්න සහතිකය

3.1.3. 1948 අංක 18 දරන පුරවැසි පනතේ 5(2) වගන්ති යටතේ නිකුත් කළ සහතිකය. (අදාළ වන්නේ නම්)

3.1.4. 1948 අංක 18 දරන පුරවැසි පනතේ 11 වගන්තිය යටතේ නිකුත් කළ සහතිකය. (අදාළ වන්නේ නම්)

3.1.5 ද්විත්ව පුරවැසි සහතිකය (අදාළ වන්නේ නම්)

3.1.6 සේවායෝජකයාගේ ලිපිය (අදාළ වන්නේ නම්)

3.1.7. විවාහ සහතිකය (අදාළ වන්නේ නම්)

**4. සාමාන්‍ය උපදෙස්**

4.1 මාර්ගගතව අයදුම් කිරීම සඳහා කරුණාකර පහත සඳහන් සබැඳිය වෙත පිවිසෙන්න.

https://www.immigration.gov.lk/

4.2 අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය.

4.3 'හදිසි සේවා' යටතේ ඉල්ලුම්කල අයදුම්කරුවන්ට කුරියර් සේවාව මගිනුත්, 'සාමාන්‍ය සේවා' යටතේ ඉල්ලුම්කල අයදුම්කරුවන්ට ලියාපදිංචි තැපෑලෙනුත් විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීමට පහසුකම් සැලසෙනු ඇත.

4.4 කුරියර් ගාස්තු /තැපැල් ගාස්තු දෙපාර්තමේන්තුව විසින් දරනු ඇත.

4.5 ඔබ දැනටමත් ඡායාරූපය ලබාගෙන ඇත්නම්, කරුණාකර එම ඡායාරූපයට අදාල යොමු අංකය ඇතුළත් කරන්න.

4.6 උඩුගත කිරීම සඳහා අවශ්‍ය සියලුම ලිපිලේඛන JPEG ආකෘතියෙන් තිබිය යුතු අතර ගොනු ප්‍රමාණය 5 MB ට වඩා අඩු විය යුතුය.

## 5. සේවා පහසු කිරීමේ මධ්‍යස්ථාන සඳහා උපදෙස්

5.1 පහත සඳහන් සේවා පහසු කිරීමේ මධ්‍යස්ථානවලින් එකක් තොරා ගන්නා මෙන් ඔබෙන් ඉල්ලා සිටිනු ලැබේ.

- 5.1.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය
- 5.1.2. දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල
- 5.1.3. නම් කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ස්ථාපිත කර ඇති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ උපකාර්යාලයන් (DS – DRP). (නම් කරන ලද DS – DRP ලැයිස්තුව සඳහා පහත අංක 8 බලන්න.

5.2 තෝරාගන්නා ලද සේවා පහසු කිරීමේ මධ්‍යස්ථාන වලදී පහත සඳහන් සේවාවන් ඔබ වෙත ලබාදෙනු ලැබේ.

- 5.2.1. අයදුම්කරුගේ ඇඟිලි සලකුණු (අනිවාර්ය අවශ්‍යතාවය)
- 5.2.2. අයදුම්කරුගේ අත්සන (අනිවාර්ය අවශ්‍යතාවය)
- 5.2.3. අයදුම්කරුගේ සක්‍රිය කරන ලද ජෛවමිතික ඡායාරූපය (විකල්ප)

5.3 අයදුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදී, 'මාර්ගගත විදේශ ගමන් බලපත්‍ර සඳහා වේලාව වෙන් කිරීමේ නිවේදනයක්' ඔබගේ උපාංගයට එවනු ඇති අතර, ඒ සමඟම ලියාපදිංචි වී ඇති ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් එවා, අයදුම්පත් යොමු අංකය දැනුම් දෙනු ඇත.

5.4 ගෙවීම සාර්ථක ලෙස සිදු කළ විට කෙටි පණිවුඩයක් මගින් ඒ බව සනාථ කෙරෙනු ඇත.

5.5 ඔබගේ අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් පිළිගත් වහාම ඔබ වෙත කෙටි පණිවුඩයක් ලැබෙනු ඇත. ඔබට කෙටි පණිවුඩය ලැබෙන තුරු ඇඟිලි සලකුණු ලබාදීම සඳහා අදාල මධ්‍යස්ථානය වෙත වාර්තා නොකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

5.6 ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ උපකාර්යාලයට වාර්තා කරන විට පහත සඳහන් දෑ ඉදිරිපත් කිරීමට ඔබ සූදානම්ව සිටිය යුතුය;

- 5.6.1. ඇඟිලි සලකුණු ලබා දීම සඳහා දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීමේ දැන්වීම (අනිවාර්ය)
- 5.6.2. උප්පැන්න සහතිකය (අනිවාර්ය)
- 5.6.3. ජාතික හැඳුනුම්පත (අනිවාර්ය)
- 5.6.4. වත්මන් විදේශ ගමන් බලපත්‍රය (විදේශ ගමන් බලපත්‍රයක් පවතී නම්)

## 6. අයදුම් කිරීම සඳහා කොන්දේසි

6.1 ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රයක් අයදුම් කිරීම සඳහා ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර ඉල්ලුම් කරන අවස්ථාවේදී ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටිය යුතුය.

6.2 විදේශ ගමන් බලපත්‍ර අයදුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා ලියාපදිංචි වීම සඳහා ඔබට වලංගු ජංගම දුරකථන අංකයක් තිබිය යුතු අතර විදේශ ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කිරීම සඳහා වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයක්ද අවශ්‍ය වේ.

6.3 ඔබ ප්‍රථම වරට විදේශ ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කරන්නේ නම් පහත ලිපිලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුවේ.

6.3.1. උප්පැන්න සහතිකය

6.3.2. ජාතික හැඳුනුම්පත

6.4 ඔබ සතුව දැනටමත් වලංගු ශ්‍රී ලාංකේය විදේශ ගමන් බලපත්‍රයක් තිබේ නම්, ඇඟිලි සලකුණු ලබා දීම සඳහා ඔබ ප්‍රධාන කාර්යාලයට / ප්‍රාදේශීය කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු (DS-DRP) ඒකකයන් වෙත වාර්තා කරන විට වර්තමානයේ ඔබ සතුව ඇති විදේශ ගමන් බලපත්‍රය රැගෙන යා යුතුය.

6.5 ඔබගේ වලංගු විදේශ ගමන් බලපත්‍රය නැති වී ඇත්නම්. ඔබගේ නව විදේශ ගමන් බලපත්‍රය සැකසීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට / ප්‍රාදේශීය කාර්යාලයකට වාර්තා කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි.

6.6 ඔබ වයස අවුරුදු 60 ට වැඩි අයෙකු නම් හා ඔබ දැනටමත් විදේශ ගමන් බලපත්‍රයට අදාල ඡායාරූප ලබාගෙන තිබේ නම්, ප්‍රධාන කාර්යාලයට / ප්‍රාදේශීය කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු (DS-DRP) ඒකකය වෙත නොගොස්, අත්සන් ආකෘතිය බාගත කර ඍජුවම ආදර්ශ අත්සන උඩුගත කළ හැකිය.

6.7 ඔබ වයස අවුරුදු 16 ත් 60 ත් අතර පුද්ගලයෙකු නම්, අත්සන සහ ඇඟිලි සලකුණු ලබා දීමටත්, ඔබේ ඡායාරූපය ග්‍රහණය කිරීමටත් ඔබ ප්‍රධාන කාර්යාලයට, තෝරාගන්නා ලද ප්‍රාදේශීය කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ඒකකය වෙත පැමිණීමට අවශ්‍යවේ.

**7. ගෙවීම්**

7.1 හදිසි සේවය සඳහා ගාස්තුව රුපියල් 15,000 ක් වන අතර සාමාන්‍ය සේවය සඳහා ගාස්තුව රුපියල් 5000 කි.

7.2 ඔබ විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ඒකකවලදී ලබා ගැනීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා අදාළ ගාස්තුව රුපියල් 350 කි.

7.3 ඔබට මාර්ගගත ලෙස ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඔබ සතුව වලංගු හර / බැර කාඩ්පතක් (Credit /Debit) තිබිය යුතුවේ. නොඑසේනම් ඔබට 'බැංකුවේදී ගෙවන්න' ('Pay at Bank' ) යන්න තොරාගත හැක.

7.4 ඔබ 'බැංකුවේදී ගෙවන්න' ('Pay at Bank' ) සහ විකල්පය තෝරා ගනු ලබන්නේ නම්, පළමුව අදාල තෝරා ගැනීමෙන් පසු ලැබෙන රිසිට්පත බාගත කර, මුද්‍රණය කරගත යුතුය. එම රිසිට්පත ඉදිරිපත් කර ළඟම ඇති ලංකා බැංකු (BOC) ශාඛාවන් මගින් මුදල් ගෙවීම සිදුකල හැක.

**8. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ උපකාර්යාලයන්හි ස්ථාපිත කර ඇති නම්කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල (DS-DRP) ලැයිස්තුව.**

| දිස්ත්‍රිකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
|---|---|
| අම්පාර | සමන්තුරේ, පොතුවිල් |
| අනුරාධපුර | නුවරගම් පලාත මධ්‍යම, කැකිරාව, හොරොව්පතාන |
| බදුල්ල | මහියංගනය, හපුතලේ |
| මඩකලපුව | කෝරලෙයිපත්තුව (වාලච්චේන), කාත්තන්කුඩි |
| කොළඹ | සීතාවක, හෝමාගම |
| ගාල්ල | කරන්දෙණිය, අක්මීමන, නෙළුව |
| ගම්පහ | මීගමුව, මීරිගම, ගම්පහ |
| හම්බන්තොට | තංගල්ල, තිස්සමහාරාම |
| යාපනය | චාවකච්චේරිය, පේදුරුතුඩුව |
| කළුතර | ඉංගිරිය, මතුගම, පානදුර |
| මහනුවර | ගම්පොල, කුණ්ඩසාලේ, පූජාපිටිය |
| කෑගල්ල | ගලිගමුව, රුවන්වැල්ල |

| | |
|---|---|
| කිලිනොච්චි | කරච්චි |
| කුරුණෑගල | පු. ලි. දෙ. වයඹ පළාත් ප්‍රාදේශීය කාර්යාලය, නැගෙනහිර කුලියාපිටිය, නිකවැරටිය |
| මන්නාරම | මාන්තෙයි බටහිර |
| මාතලේ | නාවුල |
| මාතර | අතුරලිය, දෙවිනුවර |
| මොනරාගල | බුත්තල |
| මුලතිව් | මුලතිව් |
| නුවරඑළිය | අඹගමුව, වලපනේ |
| පොලොන්නරුව | ඇලහැර, දිඹුලාගල, හිඟුරක්ගොඩ |
| පුත්තලම | පුත්තලම, හලාවත |
| රත්නපුර | බලංගොඩ, කුරුවිට, ඇඹිලිපිටිය |
| ත්‍රිකුණාමලය | කින්නියා |
| වව්නියාව | වෙංගලසෙට්ටිකුමලම් |